www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# චීන ජනාධිපතිවරයා "සුසංගත සමාජයක" අවශ්‍යතාව දේශනා කරයි

## Chinese president preaches the need for "a harmonious society"

**ජෝන් චැන් විසිනි**
**2005 මාර්තු 12**

පසුගිය සති අන්තයේ බීජිංහි ප්‍රධාන මහජන ශාලාවේ ආරම්භ වූ චීනයේ ජාතික මහජන සමුලුවේ වාර්ෂික රැස්වීම පැවැත්වෙන්නේ වැඩී යන සමාජ ආතතීන්ගේ සෙවනැල්ල යටතේ ය.

*නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පතේ ලිපියකට අනුව රටෙහි වර්ධනය වන සමාජ ප්‍රශ්නවලට ප්‍රවේශයක් සපයා ගැනීම සඳහා සාකච්ඡා කිරීමට රජයේ ඉහල නායකත්වය ජාතික මහජන සමුලුවේ (ජාමස) මුව විට දී ඩියාඕයුතායි රාජ්‍ය අමුත්තන්ගේ ශාලාවට රැස් වූහ. එහි නිගමනය වූයේ ''ආර්ථික වර්ධනය'' පිලිබඳ නිල අලංකාරෝක්තිය වෙතින් ''සමාජ සුසංගත භාවය'' කරා අවධානය යොමු කෙරෙන නව දෘෂ්ටිවාදාත්මක ව්‍යාපාරයක අවශ්‍යතාව යි.

''සුසංගත සමාජයක්'' ගොඩ නැගීම සඳහා වන ආයාචනයන් ද සමග ජාමස වෙත කරන ලද කතාවකින් ජනාධිපති හියු ජින්ටාවෝ මෙම ව්‍යාපාරය දියත් කලේ ය. ''ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ පාලනය, සාධාරනත්වය, අවංක භාවය, මිත්‍රත්වය හා ජීව ගුනය'' වර්ධනය කිරීම මෙන් ම ජනතාව හා ආන්ඩුව අතර සහ, ''මිනිසා හා සොබාදහම අතර'' වඩා හොඳ සම්බන්ධතාවක් ගොඩනැගීමේ සිය සංකල්පය ඔහු සාරාංශගත කලේ ය.

මෙම ඝෝෂාකාරී අදහස් පිටුපස ඊට අනුරූපී සමාජ ප්‍රශ්නාවලියක් තිබේ: ප්‍රජාතන්ත්‍රීය අයිතීන් නැතිකම, ඉහවහා ගිය නිල දූෂනය, පොහොසතුන් හා දුප්පතුන් අතර වර්ධනය වන යෝධ පරතරය, ග්‍රාමීය හා නාගරික ප්‍රදේශ අතර පුලුල් වන විෂමතාවන් හා නිදන්ගත විරැකියාව, කාර්මික විපත්තින්ගේ බිහිසුනු වර්තාව ද උග්‍ර පරිසර දූෂනය යි. මෙම එකදු ගැටලුවකට හෝ විසඳුමක් සැපයීමට බීජිං පාලනය දක්වන අසමර්ථතාව පැතිර යන විරෝධතාවන් අවුලුවා ඇත.

මෙම සතියේ බීජිං හි සිදු කල යෝධ ආරක්ෂක මෙහෙයුම් රජය හා මහජනතාව අතර යථා සම්බන්ධතාව පිලිබඳව සාක්ෂි දරයි. සමුලුවට හා ඒ සමග සම්බන්ධ චීන මහජන දේශපාලන උපදේශක සම්මේලනයට (මදේඋස) -ව්‍යාපාර පිලිබඳ රජයට උපදෙස් දෙන මන්ඩලයකි. - ට පෙරාතුව 650,000 වන පොලිස් ආරක්ෂක නියාමක හා ප්‍රාදේශීය නේවාසික කොමිටි සාමාජික පිරිසක් අගනුවර වීදිවල මුර සංචාරය සඳහා යොදවනු ලැබී ය. තම දුක්ගැනවිලි කෙරෙහි අවධානය යොමු කර ගැනීමට රටේ සැම ප්‍රදේශයකින් ම පැමිනි සිය ගනන් පෙත්සම්කරුවන් කොටු කර බස්වල පටවා ගෙනයනු ලැබූහ.

බීජිංහි ජනතා විශ්ව විද්‍යාලයේ ආචාර්යවරයකු වන මාඕ ෂවුලොං *ෆයිනෑන්ෂල් ටයිම්ස්* පුවත් පතට ප්‍රකාශ කල අකාරයට හියු ගේ නව ප්‍රතිපත්තිය ''සමාජ පන්තීන් අතර අතිශය බැරෑරුම් ගැටුම්වල'' ප්‍රතිඵලයකි. සුවපහසු වටපිටාවක් සහිත ශාලාවක අසුන්ගෙන සිටි 3000ක් පමන සමුලු නියෝජිතයන්ට- ප්‍රධාන වසයෙන් ම තෝරා බේරා ගත් ව්‍යාපාරිකයන්, වෘත්තිකයන් හා රාජ්‍ය නිලධාරීන් වන - සිය එදිනෙදා පැවැත්ම සඳහා අරගලයක නිරතව සිටින දශ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන්, ගොවීන් හා විරැකියාවට මුහුන දී සිටින්නන් සමග පොදු වූ කිසිවක් තිබුනේ නැත.

රැකියාවලින් ඉවත් කරනු ලැබූ මිලියන ගනන් කම්කරුවන් ට රැකියා ලබාදීම සඳහා යුආන් බිලියන 10.9ක්. (එජ ඩොලර් බිලියන 1.3ක්) ද විශේෂයෙන් ම රටේ ගල් අඟුරු ආකරවල කාර්මික ආරක්ෂාව වැඩි දියුනු කිරීම සඳහා තවත් යුආන් බිලියන 3ක් ද වියදම් කිරීමට අගමැති වෙන් ජියාබාඕ තම කතාවේදී පොරොන්දු විය. මිලියන 730ක් වන ගොවීන් ගෙන් අය කරන මධ්‍යම රජයේ කෘෂිකාර්මික බද්ද අහෝසි කිරීමටත් ග්‍රාමීය දුප්පත් දරුවන්ට අධ්‍යාපන සහනාධාර සම්පාදනය කිරීමටත් ඔහු පොරොන්දු විය.

වෙන් තම සුවිශේෂ අවධානය යොමු කලේ බිලියන 140ක් වන චීනයේ ලාභ ශ්‍රම හමුදාවේ කොඳු නාරටිය වන ග්‍රාමීය සංක්‍රමනික කම්කරුවන් වෙත ය. ''සංක්‍රමනික නාගරික කම්කරුවන්ට වැඩ කරන කාලයට සම්පූර්න වැටුප් ගෙවීමටත් ඔවුන්ට නොගෙවූ වැටුප් ලබා දීම දිගට ම ක්‍රියාත්මක වීම සහතික කරනු ඇතැයි'' ඔහු කීවේ ය. නො ගෙවා ඇති වැටුප් ප්‍රමානය ඇමරිකානු ඩොලර් බිලියන 12 ක් තරම් විශාල බව නිල වර්තා පවසයි.

මෙම සීමිත පියවරයන් සඳහා මුදල් සම්පාදනය කිරීමට බීජිං පාලනය සැලැසුම් කරන්නේ ජාතික

ආදායම - 2004 දී යුආන් ට්‍රිලියන 2.64 (එජ ඩොලර් බිලියන 318) දක්වා සියයට 21.4 කින් වැඩි කිරීමෙන් හා යටිතල පහසුකම්වල ආයෝජන කපාහැරීමෙනි. පසුගිය වසරේ උමතු සහගත සියයට 9.5ක ආර්ථික වර්ධනයක් සටහන් කල අතර සමුලු නියෝජිතයන් වෙත බෙදා හරිනු ලැබූ 2005 අයවැය වර්තාවෙන් අඩු වර්ධන වේගයක්, රජයේ හිඟය කප්පාදු කිරීමක් හා ''සමාජ ව්‍යාපෘතීන්'' සඳහා වැඩි මුදල් ප්‍රමානයක් ඉල්ලා සිටියි.

*චයිනා ඩේලි* නිල පුවත්පත උදාරම් ලීලාවෙන් මෙසේ ප්‍රකාශ කලා ය. ''ජාතියේ පිම්බෙන භාන්ඩාගාරය ප්‍රයෝජනයට ගැනීම සඳහා සමාජ ව්‍යාපෘතීන් මත වැඩියෙන් වියදම් කල යුතු වේ. රාජ්‍ය මූල්‍ය පද්ධතිය ආර්ථික වර්ධනයේ උත්තේජකයක සිට සමාජ අපේක්ෂාවේ උත්තේජකයක් දක්වා පරිවර්තනය කිරීමෙන් පමනක් අප වර්තමානයේ මුහුන දෙන සමාජ ගැටලුවලින් බොහොමයකට හරියාකාර විසඳුම් ලබාදිය හැකි වේ.''

## ආර්ථික ගැටලු

වර්තමාන සමාජ ව්‍යසනය නිර්මානය කලා වූ වෙලඳපොල ප්‍රතිසංස්කරනයේ දශක දෙක ආපසු හැරවීමේ අදහසක් ආන්ඩුවට ඇත්තේ නැත. සමාජ ප්‍රශ්න පොරබැදීම පිලිබඳ සුරංගනා කතා සියල්ල බෙහෙවින්ම පුරසාරම් ය. උදාහරනයක් ලෙස මධ්‍යම ආන්ඩුව කෘෂිකාර්මික බද්ද කපා හැරීමට කරන යෝජනාවෙන්, බීජිං වෙතින් ලැබෙන ආධාරවල අඩුව තම මූල්‍ය සම්පත් ඉහල නංවා ගැනීම මගින් පියවා ගැනීමට සිදුව ඇති ප්‍රාන්ත හා ප්‍රාදේශීය අධිකාරීන් විසින් පනවනු ලබන බදු බර අඩු නො කරනු ඇත.

සුප්‍රකට ගොවි ක්‍රියාකාරිකයෙකු වන ෂැං යාඕජී ඇමරිකානු හඬ වෙත මෙසේ කීයඃ ''යථාර්ථය නම් මධ්‍යම ආන්ඩුව රට පුරා අය කරන්නේ අඩු මට්ටමක බද්දකි. වඩා වැදගත් වන්නේ අතිරේක සැඟවුනු වියදම් ය. ෂැංඩොං පලාතේ ගොවි සහෝදරයෙක් මට පැවසුවේ පවුලක සෑම පුද්ගලයෙකුගෙන් ම අය කරන ඉඩම් බද්ද බාගයකින් අඩු කර ඇති බවත් එයින් වසරකට යුආන් 70ක් (එජ ඩොලර් 8ක්) ඉතිරිවන බවත් ය. එහෙත් ඔහු තව දුරටත් ප්‍රකාශකලේ බදු කපා හැරීමට වඩා පොහොර මිල ඉහල යාම වැනි වූ වගා වියදම් බෙහෙවින් බරපතල බවයි.''

අයවැය මූලෝපායේ ප්‍රධාන තල්ලුව මූලික සමාජ අවශ්‍යතාවන් සම්පාදනය සඳහා මුදල් යෙදවීම නොව අධික ලෙස රත්වී ඇති ආර්ථිකය ගැඹුරු අවපාතයකට ඇද වැටීමෙන් වලක්වා ගැනීමට උත්සාහ කිරීමයි. වානේ, සිමෙන්ති, මෝටර් රථ හා දේපලවල යෝධ ආයෝජන, මූල්‍ය බුබුල පිපිරීමට ආසන්නය යන භීතිය ඉහල නංවා ඇත. පසු ගිය වසරේ දී චීනය තුල 150,000ක් පමන ඉදිකිරීමේ හා කර්මාන්තශාලා ව්‍යාපෘති අරඹනු ලැබිනි.

''සාර්ව ආර්ථික'' පාලනයක බලපෑම අවම මට්ටමකට වැටී තිබීම පිලිබඳව ආන්ඩුව දැඩි කනස්සල්ලට පත්ව සිටියි. උද්ධමනය පාලනය කිරීම සඳහා ආන්ඩුව නය දීම පාලනය කොට ඇති අතර ඉඩම් පාවිච්චිය සඳහා අනුමැතිය දීම් සීමා කොට ඇත. ''වර්තමානයේ දී සාර්ව ආර්ථික සැකසුම් රැඳී තිබෙන්නේ තීරනාත්මක අදියරයකයි. සුලු ලිහිල් කිරීමක් අපගේ පූර්ව උත්සාහයන් අපතේ යවමින් එය ආපසු හැරවිය හැකි ය'' යි මධ්‍යම රජයේ ආර්ථික නිලධාරියකු වන මා කායි  මාධ්‍ය වෙත පැවසී ය.

යථාර්ථය නම්, චීනය තුලට ගලා එන දැවැන්ත විදේශීය ප්‍රාග්ධනය පිලිබඳව බීජිං ආන්ඩුවට කිසිදු පාලනයක් ඇත්තේ නැත. වර්තමානයේ බොහෝ කර්මාන්ත තුල ඇති අන්තර්ජාතික සංගතවල ආධිපත්‍යය සීමා කිරීම සඳහා ''ඒකාධිකාර විරෝධී නීතියක්'' පිලිබඳව සමුලුව සලකා බලමින් සිටී. එහෙත් නව නීති වර්තමාන ඒවාට වඩා කුමන ලෙසකින් වත් ඵලදායී නො වනු ඇත.

උදාහරනයක් ලෙස සුපිරි වෙලඳසැල් හිමියෝ 300කට වැඩි ගනනක් සහභාගි වූ සමීක්ෂනයක් පෙන්නුම් කලේ එම ව්‍යවසායන්හි විදේශ ආයෝජනයෙන් මධ්‍යම රජයේ අනුමැතිය ලබා ඇත්තේ 28ක් පමනක් බවයි. අනෙක් ඒවාට ආයෝජන පැමින ඇත්තේ ප්‍රාදේශීය බලධාරින් හරහා ''නීති විරෝධීව'' ය. මෙම ප්‍රාදේශීය බලධාරීහු විදේශ ප්‍රාග්ධනය සඳහා එකිනෙකා සමග බෙලිකපාගන්නා තරඟයක යෙදී සිටිති.

ලෝක වෙලඳ සංවිධානයේ එකඟතාවට අනුව ලබන වසරේ දී චීනය තම බැංකු පද්ධතිය විවෘත කල විට මූල්‍ය පාලනයේ දුබලතා තවත් සංකීර්න වනු ඇත. විදේශ බැංකුවල තරඟය මතින් රාජ්‍යය බැංකුවලට තම කඳු ගැසෙන බොල් නය සමුච්චය වීම අඩුකිරීමට, බල කෙරෙනු ඇත. මෙහි ප්‍රතිඵලය වනු ඇත්තේ රාජ්‍ය ව්‍යවසායන් බංකොලොත්වීමේ නව රැල්ලක් හා මහා පරිමානයේ රැකියා කප්පාදුවකි.

රටෙහි බැංකු නියාමන කොමිසමට අනුව චීන බැංකු විසින් පවත්වා ගෙන යනු ලබන නය මට්ටම 2004 වසරේ දී ඩොලර් ට්‍රිලියන 3.66 දක්වා සියයට 13.4කින් ඉහල ගියේ ය. රාජ්‍ය බැංකුවල මෙයින් ඩොලර් ට්‍රිලියන 1.96ක්රාජ්‍ය බැංකු සතු විය. විශාලතම රාජ්‍ය වානිජ බැංකු හතර විසින් පවත්වා ගෙන යනු ලබන අක්‍රීය නය සංචිත ඩොලර් බිලියන 208 ද මෙයට අයත් ය. බොල් නයෙහි සැබෑ මට්ටම මීට වඩා වැඩි වේ යයි ගනන් බලා ඇති අතර සමහර විශ්ලේෂකයන් ට අනුව එය දල දේශීය නිෂ්පාදිතයෙන් (දදේනි) සියයට 40 (40%) කට වඩා වැඩි වේ.

මූල්‍ය වෙලඳපොලවලදී චීනයේ බැංකු පද්ධතිය සලකනු ලබන්නේ කාල බෝම්බයක් ලෙස ය. එසේ

වුවද එය එක්සත් ජනපද මූල්‍ය පද්ධතියේ ප්‍රධාන මුක්කුවලින් එකකි. පසුගිය වසරේ ඩොලර් ට්‍රිලියන 1 ඉක්ම වූ චීනයේ විදේශ වෙලඳාමෙන් ඩොලර් බිලියන 610ක් යෙදවුනේ, ප්‍රධාන වසයෙන් ඩොලර් පදනම් කරගත් වත්කම්වල ස්වරූපයෙන්, විදේශ මූල්‍ය සංචිතවලම ය. අනෙකුත් ආසියානු මහ බැංකු සමග එක්ව මෙම වත්කම් එක්සත් ජනපදයේ යෝධ වෙලඳ හා අයවැය හිඟයන් පියවා ගැනීමට උපකාර විය.

## වැඩි වී ඇති මිලිටරි වියදම්

ජාතික මහජන සමුලුව හමුවේ ඇති ප්‍රධාන අංගයක් වන්නේ සඳුදා ඡන්දයට ගැනීමට නියමිත යෝජිත ''වෙන්වීමට විරුද්ධ නීතිය'' යි. තායිවානය විසින් නිදහස ප්‍රකාශ කරන ඕනෑම පියවරකට විරුද්ධව මිලිටරි බලය භාවිතා කිරීම නිත්‍යානුකූල කිරීම සඳහා මෙම නීතිය යොදා ගැනීමට නියමිත ය. තායිවානය කෙරේ අවධානය යොමු කෙරෙන අර්ථභාරී සාධකයක් වන්නේ රට තුල සමාජ ආතතීන්ගෙන් අවධානය පීලි පැන්නවීම සඳහා චීන ජාතිකවාදය අවුස්සා ලීමට ව්‍යාජ හේතුවක් සපයා ගැනීම යි.

''වෙන් වීමට විරුද්ධ නීතිය'' සමග එක පෙලට - නවීන ආයුධ මිලට ගැනීම ද ඇතුලත් ආරක්ෂක වියදම් සියයට 12.6කින් වැඩි කිරීමට යෝජිත ය. කෙසේ වුවද වියදම් වැඩි කිරීමේ එක් අංශයකට ලැබී ඇත්තේ අඩු අවධානයකිඃ සොල්දාදුවන්ගේ පඩි වැඩි කිරීම හා සුභසාධන කටයුතු සම්පාදනය කිරීම මෙම තීරනය පිලිබිඹු කරන්නේ හමුදාවේ මිලියන දෙකක් වන සොල්දාදුවන්ගේ - චීන පාලන තන්ත්‍රයේ මුරගල මෙය යි - පක්ෂපාතීත්වය පිලිබඳ පාලන කව තුල පවතින දුර දිග යන කනස්සල්ලයි.

අතීතයේ දී ග්‍රාමීය තරුනයන් හමුදාවට ඇතුල්වීමට පොලඹවා ගැනීමේ උපක්‍රමයක් ලෙස බීජිං පාලනය විසින් හමුදා නිපුනයන්ට රාජ්‍ය ව්‍යවසායයන් ද ආන්ඩුවේ ද රැකියා සැපයී ය. එහෙත් රාජ්‍ය ව්‍යවසායන් වසා දැමීම හෝ විකුනනු ලැබීමේ ද රාජ්‍ය නිලධරය කප්පාදුවේ ද, තතු යටතේ එය තව දුරටත් එසේ නො වේ. රැකියා හා සුභසාධන නොමැති කමට එරෙහිව ජනිත කෙරී ඇති සොල්දාදුවන්ගේ විරෝධතාවන්ට දූන් ආන්ඩුව මුහුන දෙමින් සිටී.

හමුදාවේ අසහනය බැඳී ඇත්තේ හමුදා භටයන්ගෙන් බහුතරය බඳවා ගනු ලබන්නාවූ චීන ග්‍රාමීය ප්‍රදේශවල ගැඹුරු වන අර්බුදය සමගයි. ග්‍රාමීය ප්‍රදේශවල පහත වැටෙන ආදායම් මට්ටම්, රැකියා හා පිරිහෙමින් පවතින විශේෂයෙන් අධ්‍යාපනය හා සෞඛ්‍යය ඇතුලු සමාජ සේවාවන්හි පිරිහීම මගින් සංකීර්න කරනු ලැබ ඇත.

සම්මත සිව් අවුරුදු විශ්වවිද්‍යාල පාඨමාලාවක පිරිවැය දුප්පත්ම ගොවීන්ගේ 35 වසරක ආදායමට සමාන වේ. ජනගහනයෙන් සියයට 60 කටත් වඩා ජීවත් වන ග්‍රාමීය ප්‍රදේශවලට වැය කරන්නේ ජාතික අධ්‍යාපන වියදමෙන් - රාජ්‍ය හා පෞද්ගලික - සියයට 23ක් පමනි. රටෙහි මිලියන 900ක් වන ග්‍රාමීය ජනතාවගෙන් හරි අඩකට ම වෛද්‍ය ප්‍රතිකාර ලබා ගත නොහැකි බව සෞඛ්‍ය අමාත්‍යංශය පිලිගත්තා ය. පසු ගිය වසරේ පිහිටුවන ලද සමුපකාර වෛද්‍ය ක්‍රමය ට ගෙවිය යුතු වන යුආන් 10ක දායක මුදල බොහෝ ගොවීන්ට ගෙවා ගත නොහැකි ය.

ආන්ඩු විරෝධයේ මට්ටම ජාතික මහජන සමුලුව වෙත ඉදිරිපත් කල උත්තරීතර ජනතා නියෝජිත සභාවේ වාර්ෂික වාර්තාවෙන් මතු කර දක්වනු ලැබී ය. රාජ්‍ය ආරක්ෂාව තර්ජනයට ලක් කිරීම හෝ බෙදුම්වාදී, ත්‍රස්තවාදී හෝ අන්තවාදී ලෙස සැලකෙන කටයුතුවල නිරතවීමේ වරදට 811,102ක් දෙනා පසුගිය වසරේදී අත් අඩංගුවට ගනු ලැබින. එය 2003 ට වඩා සියයට 8.3 ක වැඩිවීමක් විරෝධතාකරුවන්ට එරෙහිව නිරන්තරයෙන් එවැනි චෝදනා භාවිතා කරනු ලැබේ.

නිව් යෝර්ක් ටයිම්ස් හි මෑතක දී පලවූ ලිපියක් විස්තර කල පරිදිඃ ''මිලියන ගනන් ඉඩම් නැති ගොවීන් දැන් චීනයේ සිටිති. ඔවුන්ගේ තත්වය සහ වැඩෙන අසහනය 1949 දී බලයට ඒම සඳහා කොමියුනිස්ට්වරු ප්‍රයෝජනයට ගත් කොන්දේසිවලට වඩා සම්පූර්නයෙන් ම වෙනස් නො වේ.'' තියුනු සමාජ අර්බුදයේ අන්තරායන් පිලිබඳව හොඳින් දැනුවත් චීන පාලන තන්ත්‍රය පීඩක යන්ත්‍රනය ශක්තිමත් කිරීමේ මං සොයමින් සිටිති. ඒ අතරම නොසන්සුන් සොල්දාදුවන් අස්වැසීමේ ක්‍රමයක් ලෙස චීන පාලන තන්ත්‍රය පොලිස් මෙහෙයුම් සඳහා ඔවුන් යොදා ගනිමින් සිටිති.

ෂෙන්ෂෙන් විශේෂ ආර්ථික කලාපයේ පාලකයන් මෑත දී නිවේදනය කලේ නාගරික අසහනය මැඩීමේ මෙහෙයුම්වල යෙදී සිටින තම පොලිස් හමුදාවට ''සටන් පුහුනුවීමේ මධ්‍යස්ථානයක්'' ගොඩනැගීම සඳහා තමන් යුආන් මිලියන 100ක් වියදම් කරනු ඇති බවයි. මෙය චීනය පුරා ප්‍රධාන නගර 21ක ගොඩනැංවෙන මේ සමාන කටයුතුවල ආදර්ශ ආකෘතියකි. හියු ජින්ටාඕගේ ''සුසංගත සමාජයේ'' සැබෑ මුහුනුවර එවැනි පියවරයන්ගෙන් පෙන්නුම් කරයි.